# ප්‍රසම්පාදන දැන්වීම

## ශ්‍රී ලංකා නාවික හමුදාව

**2026 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2027 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාවට අවශ්‍ය නැව්, යාත්‍රා සහ නාවික කටයුතු සඳහා යොදා ගන්නා තීන්ත මිලදී ගැනීම සඳහා නිෂ්පාදකයින්ගෙන්/ ආනයනකරුවන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ මිල ගණන් කැඳවීම**

1. ශ්‍රී ලංකා නාවික හමුදාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත **2026 වර්ෂයේ ජනවාරි මස 01** වන දින සිට **2027 වර්ෂයේ දෙසැම්බර් මස 31** වන දින දක්වා නැව්, යාත්‍රා සහ නාවික කටයුතු සඳහා යොදාගන්නා තීන්ත මිලදී ගැනීම වෙනුවෙන් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ සැපයිය හැකි නිෂ්පාදකයින්, ආනයනකරුවන්, සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. ඉදිරිපත් කරන මිල ගණන් වල වලංගු කාලය **2026 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2027 වර්ෂයේ දෙසැම්බර් මස 31** වන දින දක්වා විය යුතුය.

   අ. තෝරා ගන්නා කොන්ත්‍රාත්කරුවන් නාවික හමුදාව විසින් ඇණවුම් කරනු ලබන විෂයයන් මාර්ගස්ථ ගබඩාව **ශ්‍රීලංනානෞ "මහසෙන්" වැලිසර,** රාගම වෙත සැපයුම් කළ යුතුය.

   ආ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හට ආපසු නොගෙවනු ලබන **රු.20,000.00** ක අයදුම්පත් ගාස්තුව **මුදලින්, අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය** වෙත ඉදිරිපත් කර අයදුම්පත් **අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා, ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01** මගින් **2025 සැප්තැම්බර් මස 01** වන දින සිට **2025 ඔක්තෝබර් මස 08** වන දින දක්වා සතියේ වැඩකරන දින වල **1000** පැයේ සිට **1400** පැය දක්වා ලබා ගත හැකි අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත දක්වා ඇති පරිදි ඉදිරිපත් කළ යුතුය.

   ඇ. **පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2025 සැප්තැම්බර් මස 19** වන දින **1000** පැයට **ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01** ලිපිනයේදී සිදු කෙරේ.

2. 2026 - 2027 වර්ෂ සඳහා නැව්, යාත්‍රා සහ නාවික කටයුතු සඳහා යොදාගන්නා තීන්ත වල විස්තර සහ දළ අවශ්‍යතා ප්‍රමාණයන් අයදුම්පත් සමඟ නිකුත් කරනු ලබන අතර, මිල ගණන් කැඳවීම අවසන් වීම / ටෙන්ඩර් පත් විවෘත කිරීම **2025 ඔක්තෝබර් මස 09 දින, 1400** පැයට සිදු කෙරේ.

3. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය (මිල ගණන් ඇගයීමේදී මෙම කරුණු සැලකිල්ලට ගනු ලැබේ).

   අ. නැව්, යාත්‍රා සහ නාවික කටයුතු සඳහා යොදාගන්නා තීන්ත සමාන ධාරිතා බලයක් සහිතව රජයේ / පෞද්ගලික ආයතන වෙත සැපයීම පිළිබඳව වර්ෂ 02ක සතුටුදායක කාර්ය සාධනයක් තිබෙන බවට වාර්තා.

   ආ. ස්ථිර මූල්‍යමය හැකියාව.

   ඇ. බදු ගෙවීම පිළිබඳ සතුටුදායක වාර්තා.

   ඈ. ප්‍රමාණවත් පරිදි පණිවිඩ හුවමාරු පහසුකම් තිබීම.(දුරකථන, ජංගම දුරකථන, විද්‍යුත් ලිපින)

   ඉ. ප්‍රමාණවත් පරිදි ගබඩා පහසුකම් තිබීම.

   ඊ. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලයක් සිටීම සහ කාර්යාල පහසුකම් තිබීම.

උ. ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් තිබීම.

ඌ. ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයේ හෝ සංස්ථාපිත සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ලියාපදිංචි වීමෙන් පසු ආසන්න වසර 03ක කාලය තුළ අඛණ්ඩව ව්‍යාපාර කටයුතු වල යෙදී සිටි බවට වාර්තා ඉදිරිපත් කළ යුතුය.

4. අයදුම්කරුවන් තම මිල ගණන් ඉදිරිපත් කිරිමේදී වැට් බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් කර තිබීම අනිවාර්ය වේ. වැට් බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් වැට් බදු ලියාපදිංචියෙන් නිදහස් බවට සනාථ කරන සහතිකයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. තවද, ඉහත අවශ්‍යතාවයන් සපුරා නොමැති මිල ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. අයදුම්කරුවන් විසින් මිල ගණන් පත් ඉදිරිපත් කිරීමේදී ලිපි කවරයේ වම් පස ඉහල කෙළවරේ **''ශ්‍රී ලංකා නාවික හමුදාව, නැව් / යාත්‍රා සහ නාවික කටයුතු සඳහා යොදාගන්නා තීන්ත සැපයීම සඳහා කොන්ත්‍රාත් මිළ ගණන් ඉදිරිපත් කිරීම'' එස්එල්එන්/එල්ඕජී/31/ආර්සී/2026** ටෙන්ඩර් පත් විවෘත කරන දිනය, වේලාව සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පහත ලිපිනයේ තබා ඇති **ඒකක කොන්ත්‍රාත් ටෙන්ඩර් බහාලුම් පෙට්ටියේ** තැම්පත් කිරීමට කටයුතු කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා නාවික හමුදාව,**
**නාවික හමුදා මූලස්ථානය,**
**තැ.පෙ 593,**
**කොළඹ 01.**

6. මිල ගණන් පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව පසු වූ වහාම ලද අයදුම්පත් විවෘත කරනු ලැබේ. අයදුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු හට මිල ගණන් විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විවෘත කිරීමකින් තොරව ආපසු භාරදෙනු ලැබේ.

7. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්, ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද මිල ගණන් පත් සහ නිසි පරිදි සහතික නොකරන ලද මිල ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිල ගණන් පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරිමේ බලය සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

8. තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෙත ගිවිසුම් අත්සන් කිරීම සඳහා ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ.

9. ටෙන්ඩර් අයදුම්පත් කිසිදු ගෙවීමකින් තොරව **අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා, නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01** යන ස්ථානයේ පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩි විස්තර **ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (ඒකක කොන්ත්‍රාත්) දු.ක. 011 7192326** වෙතින් ලබා ගත හැක.

11. මෙම ඒකක කොන්ත්‍රාත් මිල ගණන් කැඳවීම සම්බන්ධ විස්තර නාවික හමුදා වෙබ් අඩවිය **www.navy.lk** මඟින් ද ලබා ගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා නාවික හමුදාව,
කොළඹ 01.